(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 46.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 මාර්තු 21 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

127/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ දී පැවති ජනාධිපතිවරණයෙන් පසුව මේ දක්වා මුද්‍රණය කරන ලද නෝට්ටු හා කාසිවල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කොපමණද;

(ii) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) මුද්‍රණය කරන ලද නෝට්ටු සහ කාසි වර්ග සහ එම එක් එක් නෝට්ටු හා කාසි වර්ගයෙන් මුද්‍රණය කරන ලද වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒවා මුද්‍රණය කිරීමට හේතු කවරේද;

(v) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(vi) එම නෝට්ටු හා කාසි භාවිතා කර ඇති අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, එම නෝට්ටු හා කාසිවල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

191/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජය සතු සීනි සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2022 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සීනි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජය සතු සීනි කර්මාන්තශාලාවල මේ වනවිට විකුණා ගත නොහැකිව එක්රැස් වී ඇති සීනි ප්‍රමාණය සහ එතනෝල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

221/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''ආරක්ෂිතව ගර්භණීභාවය අවසන් කිරීම'' සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ''පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්'' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඉදිරිපත් කරන ලද පොරොන්දුව ඉටු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සම්බන්ධ නව නීති කඩිනමින් සම්පාදනය කිරීම ප්‍රමාදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

294/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිරතුරුවම ගංවතුර ගැලීමේ අවදානම සහිත ගංගා සහ ඇළ දොළ කවරේද;

(ii) ඒවායේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති දේශීය හා විදේශීය ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා භාවිතා කර ඇති දේශීය අරමුදල් ප්‍රමාණය සහ විදේශීය අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇති ආයතන කවරේද;

(v) ඉහත ව්‍යාපෘති අතර විවිධ බාධා හේතුවෙන් අසාර්ථක වී ඇති ව්‍යාපෘති තිබේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

305/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව සහ එක් එක් පීඨයේ සිටින සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ විශ්වවිද්‍යාලයක එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(v) එක් එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එක් පෞද්ගලික විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු සඳහා වැය වන මුළු පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරුන් සංඛ්‍යාව සහ මහාචාර්යවරුන්ගේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රජයේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය කොපමණද;

(iii) ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු සඳහා වැයවන මුළු පිරිවැය කොපමණද;

(iv) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම කොපමණද;

(v) ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ඉහත එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය කවරේද;

යන්නත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### **යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවලින් හා 2025 පෙබරවාරි 21 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (විසිහයවැනි වෙන් කළ දිනය) — කාරක සභාව.
(මාර්තු 20 දින ප්‍රගතිය)

*2.

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන" පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.